**ගලිගමුව ප්‍රාදේශීය සභාව - 2023**
**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගලිගමුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ගලිගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

-

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු.532,414ක වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව 2023 දෙසැම්බර් 31 දිනට පුස්තකාල පොත්වල වටිනාකමට වඩා රු.1,077,251 ක් අඩුවෙන් එම වටිනාකම එදිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පරිගණකයට දත්ත ඇතුළත් කරන විට සිදුවූ අතපසුවීමකි. | - එම - |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු 4,960,951 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලද උපලේඛන ගිණුම් සඳහා ඇතුළත් නොවන බව. | - එම - |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇති රු.6,256,900 ක් වූ ඉඩම් 15 ක් හා වටිනාකම සඳහන් නොවූ ඉඩම් 08ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී ගැලපීම් සිදු කරන බව. - | - එම - |

## 1.7 අනුකූලනොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | නිරවුල් නොකළ එකතුව රු.214,371 ක් වූ වර්ෂ 02 ඉක්මවූ තැන්පතු 17 ක් ආදායමට ගෙන නොතිබුණි. | එකඟ වන බවත්, හැකි ඉක්මනින් ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30 /2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | වාහන 07 ක ඉන්ධන දහන පරීක්ෂාව 2022 වර්ෂයෙන් පසුව සිදුකර නොතිබුණි. | කොරෝනා වසංගතය හා ඉන්ධන හිඟතාව නිසා එම පරීක්ෂාව නිසි පරිදි සිදු නොකළ බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 02/2010 දරන චක්‍රලේඛයේ 4(xiii) ජේදය | වරිපනම් බදු දේපළ වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවද, වර්ෂ 15 කට වැඩි කාලයක් තිස්සේ තක්සේරු ප්‍රතිශෝධනය කර නොතිබුණි. | එකඟ වන බවත්, අවසන් තක්සේරුව 2019 සිදුකර තිබුණ ද, තක්සේරු වාර්තාව නොලද බැවින් එය ලද වහාම නව තක්සේරුව ක්‍රියාත්මක කරන බව. . | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.25,159,352 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.20,703,379 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,404,625 | 2,687,872 | 2,324,249 | 363,623 | 2,333,025 | 3,784,449 | 3,275,828 | 508,621 |
| කුලී | 6,816,990 | 3,163,894 | 2,787,649 | 376,245 | 5,094,230 | 6,663,132 | 6,659,532 | 3,600 |
| බලපත්‍ර ගාස්තු | 1,337,000 | 1,550,679 | 1,534,479 | 16,200 | 1,350,000 | 1,404,544 | 1,404,544 | - |
| වෙනත් ආදායම් | 41,617,500 | 45,233,494 | 12,441,708 | 32,791,786 | 28,207,000 | 39,690,635 | 14,628,361 | 25,062,274 |
| | **52,176,115** | **52,635,941** | **19,088,086** | **33,547,855** | **36,984,255** | **51,542,760** | **25,968,265** | **25,574,495** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම්, අක්කර බදු, කුළී හා මුද්දර ගාස්තු ශේෂය රු.33,043,057ක් වූ අතර ඒ තුළ වර්ෂ 05කට වඩා පැරණි රු.2,463,510ක ශේෂයක් විය. | මෙම මුදල් අය කරන බව | ආදායම් නොපමාව අය කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපාර සමීක්ෂණය අනුව ව්‍යාපාර 673ක් හඳුනාගෙන තිබුණද, ව්‍යාපාර බදු ලේඛනය අනුව ආයතන 828 කින් බදු මුදල් ලැබී තිබුණි. ඒ අනුව ව්‍යාපාර ඒකක 155 ක් හඳුනා නොගැනීම නිසා ව්‍යාපාර සමීක්ෂණයේ නිවැරදිතාව ප්‍රශ්ණගත විය. | එකඟ වන අතර, පෙන්වා දෙන ලද අඩුපාඩු 2024 වර්ෂයේ සිට නිවැරදි කරන බව. | ව්‍යාපාර සමීක්ෂණය නිවැරදිව සිදු කළයුතු වේ. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට රු.18,593,275ක ණයගැති ශේෂ ද, රු.2,323,463ක ණයහිමි ශේෂ ද වර්ෂ 05කට වඩා පැරණි විය. | වසර 05 ඉක්මවා ඇති ශේෂ පිළිබඳ අදාළ ආයතන වෙතින් විමසීම් කර ඇත. ඊට ලැබෙන පිළිතුරු අනුව එම ශේෂ ණයගැති ලේඛනයෙන් හා පාලන ගිණුමෙන් ඉවත් කරන බව. | ශේෂ නිරවුල් කළයුතු වේ. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 2,000,000 ක් වූ කම්පැක්ටර් ට්‍රේලරය වර්ෂ 08ක කාලයක සිට ද, රු.4,394,000 ක් වූ බොබ්කැට් යන්ත්‍රය වර්ෂයක සිට ද අභාවිතව පවතී. එමෙන්ම, ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් 02ක් වර්ෂ 02ක කාලයක සිට ද, ජෙනරේටරයක් වර්ෂ 06 ක කාලයක සිට ද අභාවිතව පවතී. | කම්පැක්ටර් ට්‍රේලරය භාවිතයට ගෙන නොමැති බවත්, ඉතිරි වත්කම් සියල්ල අලුත්වැඩියාව සඳහා යොමු කරන බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු 18ක් හා 14 දෙනෙකුගේ අතිරික්තයක් පැවැතිණි. එමෙන්ම, අනියම් ලෙස එක් අයෙකු ද, සේවා ගිවිසුම් යටතේ තිදෙනෙකු ද, දරන්නාට පුද්ගලික වන සේ 04 දෙනෙකු ද, රාජකාරී ආවරණය සඳහා 04 දෙනෙකු ද සේවයට අනුයුක්ත කර තිබුණි. | පුරප්පාඩු පිරවීම හා නිලධාරීන් සේවා ස්ථාන වෙත ස්ථානගත කිරීම සිදු කරන්නේ සබරගමුව පළාත් සභාව මගින් බව. | සේවක පුරප්පාඩු පිරවීමටත් අතිරික්ත සේවකයන් වෙනත් ස්ථානවලට අනුයුක්ත කිරිමටත් කටයුතු කළ යුතු වේ. |